රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 22/2018

මගේ අංකය: රා.ක.ස.සේ./අධි/ස්.මා./2019
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2018.09.04

අමාත්‍යාංශ ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් -2019

රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පරිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

02. ඒකාබද්ධ සේවයට අයත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් 2019 ජනවාරි මස පළමුවන දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක කළ යුතු අතර එහිදී නිලධරයන්ට මෙන්ම රාජ්‍ය සේවාවටද ඇතිවන අපහසුතා මගහැරවීම පිණිස පහත සඳහන් ආකාරයට ස්ථාන මාරුවීම් පිළිබඳ ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට සැළකිලිමත් විය යුතුය.

03. ස්ථාන මාරු මණ්ඩලය රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේදී පැවැත්වෙන අතර එහිදී සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අනෙකුත් ආයතන අතර ස්ථාන මාරුවීම් පිළිබඳ තීරණ ගනු ඇත.

04. ස්ථාන මාරුවීම් සඳහා නිලධරයන්ගේ සුදුසුකම් ආදිය ගැන තීරණ ගැනීමේදී මේ සමග අමුණා ඇති මාරුවීම් පරිපාටිය උපයෝගී කරගනු ලැබේ.

05. ප්‍රියමනාප සේවා ස්ථානයක අවුරුදු 05ක සේවා කාලයක් /දුෂ්කර සේවා ස්ථානයක අවුරුදු 02ක සේවා කාලයක් ඇති නිලධරයන් ස්ථාන මාරුවීම් ලැබීමට සුදුසුකම් ලබයි.

06. අදාල යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් විරුද්ධව කරුණු දැක්වීම සලකා බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 අති විශේෂ ගැසට් පත්‍රයේ XVIII පරිච්ඡේදයේ කාර්ය පටිපාටික රීති 210 වගන්තිය අනුව වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටුවා ඒ අනුව කටයුතු කරනු ලැබේ. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන කරුණු දැක්වීම සලකා බලනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 අති විශේෂ ගැසට් පත්‍රයේ XVIII පරිච්ඡේදයේ කාර්ය පටිපාටික රීති 211 වගන්තියට අනුකූල වේ නම් පමණි.

07. ස්ථාන මාරු නියෝගයන් සම්බන්ධයෙන් කරුණු දැක්වීම සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු විසින් පහත සඳහන් කරුණු පිළිබඳ තවදුරටත් පරීක්ෂා කර තීරණ ගනු ඇත.

- මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්
- නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු නොවුනු අවස්ථා (මනාප අනුව 1,2,3 යන සේවා ස්ථාන ඉල්ලීම් ලෙස සලකනු ලැබේ)
- නිලධරයන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්
- ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනයෙන් පසුව නිලධරයන්ට සිදුවූ හදිසි විපත්/හදිසි අනතුරු/ආපදා/අසනීප වැනි සානුකම්පිත තත්ත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒවා පිළිබඳව

08. 2018 අගෝස්තු මස 31 දින සිට 2018 දෙසැම්බර් 31 යන දින අතර කාලයේදී අනොය්නාය ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම්පත්‍ර භාර නොගත යුතුය.

09. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ නිලධරයන් සම්බන්ධව ස්ථාන මාරු කාල සටහන ස්ථාන මාරු පටිපාටියෙහි 8 වන වගන්තිය යටතේ දක්වා ඇත.

10. සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන /දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගබලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙලිවුවහොත් ඒ පිළිබඳව අදාල ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස්කල හා හරි වැරදි බලන ලද නිලධරයන් වගකීමට බැඳී සිටින අතර ඔවුන් විනයානුකූල කටයුතු වලටද යටත් වේ.

11. මාරු මණ්ඩල මගින් අමාත්‍යාංශයෙන්/දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකිවන සේ ඔවුන් මුදා හැරීමට කටයුතු කල යුතුය.

12. රාජ්‍ය කළමනාකරණ සහකාර අධිශ්‍රේණි නිලධාරීන් සඳහා 2019 වසරට අදාල වාර්ෂික ස්ථාන මාරු සඳහා බලාත්මක කාලසටහන පහත දැක්වේ.

| | |
|---|---|
| සැප්තැම්බර් 04 ට පෙර | ස්ථානමාරු පටිපාටිය/චක්‍රලේඛය ප්‍රසිද්ධ කර ඉල්ලුම්පත් කැඳවීම |
| ඔක්තොබර් 05 ට පෙර | ඉල්ලුම්පත් සහ වසර 05ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධරයන්ගේ වාර්තා ලබා ගැනීම අවසන් කිරීම. |
| ඔක්තොබර් 11 ට පෙර | මාරු මණ්ඩල රැස්වී තීරණ ගෙන අවසන් කිරීම. |
| ඔක්තොබර් 13 ට පෙර | ස්ථාන මාරු යෝජනා දැනුම් දීම. |
| නොවැම්බර් මස 10ට පෙර | ස්ථාන මාරු පිළිබඳව ඒකාබද්ධ සේවා අංශය වෙත අභියාචනා ලබාදීම. |
| නොවැම්බර් මස 15ට පෙර | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම |
| දෙසැම්බර් 20 ට පෙර | අභියාචනා මණ්ඩල තීරණ දැනුම් දීම හා වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම. |

13. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ඔබගේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ අධිශ්‍රේණියේ නිලධරයන් වෙත දැන ගැනීමට සලස්වන්න.

**පද්මසිරි ජයමාන්න**
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය
පිළිබඳ අමාත්‍යාංශ ලේකම්

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය (ඒකාබද්ධ සේවය)

01. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති 1589/30 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද කාර්ය පටිපාටික රීති 1වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව සහ 2016.02.25 දිනැති අංක 1955/22 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් පවරන ලද බලතල ප්‍රකාරව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය.

02. ඒකාබද්ධ සේවයේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් පහත දැක්වෙන ආකාරයෙන් සිදු කෙරේ.

### (අ) මාරු මණ්ඩල මගින් (වාර්ෂික ස්ථාන මාරු)

ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් මණ්ඩල ක්‍රියාත්මක කෙරේ. ඒ හැරුණු විට කිසියම් නිලධරයකුගේ සාධාරණ ඉල්ලීමක් ඉටු කිරීමට ඉඩ ලබා ගැනීම සඳහා හෝ අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් පරිපාලනමය කරුණු අනුව කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස සේවා ස්ථානයක/ප්‍රදේශයක නියමිත සේවා කාලය සම්පූර්ණ කළ නිලධරයකු වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමටද මාරු මණ්ඩල තීරණ ගත හැක. මෙම මාරුවීම් වර්ෂයේ ආරම්භක වැඩ කරන දිනයේ සිට ක්‍රියාත්මක වේ.

### (ආ) රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් මගින් (වාර්ෂික නොවන ස්ථාන මාරු)

වාර්ෂික මාරු මණ්ඩලවලදී හැර ඒකාබද්ධ සේවා අංශයේ දෛනිකව සිදුකෙරෙන කාර්යයක් වශයෙන් ස්ථාන මාරුවීම් සිදු නොකෙරේ. එහෙත් පරිපාලනමය අවශ්‍යතා, සේවා අවශ්‍යතා සහ විනය හේතු මත රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් ස්ථාන මාරු නියෝග නිකුත් කෙරේ. සාමාන්‍ය රාජකාරි කටයුතු වලට බාධාවක් නොවන සුහද ස්ථාන මාරු ඉල්ලීම්ද නිලධරයන්ගේ හදිසි වූද, සානුකම්පිතව සලකා බැලිය යුතු වූ කරුණු අඩංගු ඉල්ලීම්ද, අමාත්‍යාංශ ලේකම් වරුන්ගේ නිරීක්ෂණ හා නිර්දේශ ඇතිව ඉදිරිපත් කරන විට ඒ පිළිබඳව සළකා බලා අවශ්‍ය පියවර ගනු ලැබේ.

### 02:1 එක් අමාත්‍යාංශයක සිට තවත් අමාත්‍යාංශයකට ස්ථාන මාරු කිරීම

එක් අමාත්‍යාංශයක සිට තවත් අමාත්‍යාංශයකට නිලධරයකු මාරු කෙරෙන අවස්ථාවලදී පුරප්පාඩුව තිබෙන අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉල්ලීම/නිර්දේශය රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය. මෙහිදී මාරුව ඉල්ලනු ලැබ සිටින නිලධරයා අනුයුක්ත කොට සිටින රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟත්වයද සලකා බලා පුරප්පාඩුව ඇති අමාත්‍යාංශයට ස්ථාන මාරුවීම් නියෝගය නිකුත් කිරීම රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ඇත.

### 02:2 එකම අමාත්‍යාංශයක් තුල දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු කිරීම

අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් යෝජිත ස්ථාන මාරු කිරීම් පිළිබඳ නිර්දේශ රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එම නිර්දේශ සළකා බලා අදාල ස්ථාන මාරුවීම සඳහා අනුමැතිය ලබාදීම රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ_අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ඇත.

## 02:3 එකම දෙපාර්තමේන්තුවක් තුළ ස්ථාන මාරු කිරීම

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ස්ථාන මාරුකිරීම් පිළිබඳ යෝජනා අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුවේ. එම ඉල්ලීම අනුව ස්ථාන මාරුවීම අනුමත කිරීම අදාල අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදුකළ විටක ඒ බව රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා එවිය යුතුය.

## 02:4 විශේෂ රාජකාරි අවශ්‍යතා හා හදිසි සේවා අවශ්‍යතා මත ස්ථාන මාරු කිරීම

පරිපාලනමය හා සේවා අවශ්‍යතා මත නිලධරයකුගේ ඉල්ලීමක් නොමැතිව හා කැමැත්ත විමසීමකින් තොරව ස්ථාන මාරු කිරීමට හෝ තාවකාලිකව අනුයුක්ත කිරීමට රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ට හැකියාව ඇත.

## 03. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ ස්ථාන මාරු කමිටු සංයුතිය

රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන සේවයේ ආයතන කටයුතු භාර නිලධරයා ඇතුළු මාණ්ඩලික නිලධරයන් තිදෙනෙකු (ඉන් එක් අයකු අභියාචනා මණ්ඩල සඳහා නම් කරන ලද නිලධරයකු විය යුතුය.)

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ නිලධරයන්ගේ මුළු සේවක සංඛ්‍යාවෙන් 15% කට නොඅඩු ප්‍රමාණයක සාමාජිකත්වයක් හිමි වෘත්තීය සංගම් වලින් එක් නියෝජිතයකු බැගින්

හෝ

පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධරයකු මුදා හැර ඇති එක් වෘත්තීය සංගමයක නියෝජිතයෙක් යන අයගෙන් සමන්විත වේ.

මාරු කමිටුවේ සභාපතිවරයා රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබයි.

## 04. වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව

04:1 මාරු කමිටු තීරණ සම්බන්ධයෙන් හා මාරු මණ්ඩලවලදී තම ඉල්ලීම් ඉටු නොවීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි පරීක්ෂා කිරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් ගේ සභාපතිත්වයෙන් යුත් අභියාචනා මණ්ඩලයක් රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබයි.

## 04:2 වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ සංයුතිය

සභාපති : ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු :

I. රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අංශයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයකු,
II. ඒකාබද්ධ සේවා අංශයට අයත් නොවන වෙනත් දෙපාර්තමේන්තුවක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයකු.

සටහන :- මෙම නිලධරයන්ගෙන් එක් අයකු ස්ථාන මාරු කමිටුවේ සේවය කළ නිලධරයකු විය යුතුය.

04:3 **වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව** විසින් පහත සඳහන් කරුණු පිළිබඳ පරීක්ෂා කර තීරණ ගනු ඇත.

- මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්
- නිලධරයාගේ ඉල්ලීම් ඉටු නොවූ අවස්ථා
- ස්ථාන මාරුව සම්බන්ධව අදාල අමාත්‍යාංශ ලේකම් වරුන් විසින් රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත කරන ඉල්ලීම්, නිර්දේශ හා පැමිණිලි.

## 05. ස්ථාන මාරුවීම්වලදී සළකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති

05:1 වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාලය ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය. ( 2019 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2018.12.31 දිනය.)

05:2 සේවා කාලයන් ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරයි.

05:3 සේවා කාලය ගණනය කිරීමේදී එක් අමාත්‍යාංශයක් /දෙපාර්තමේන්තුවක් හෝ දිස්ත්‍රික්කයක් තුල අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ.

05:4 ප්‍රිය මනාප සේවා ස්ථානවල ගතකළ සේවා කාලය ගණනය කිරීමේදී, පූර්වාසන්න වසර 15 තුල සේවය කළ ( එම කාල පරිච්ඡේදවල ප්‍රිය මනාප යයි හඳුන්වනු ලැබූ ) ප්‍රිය මනාප සේවා ස්ථාන කිහිපයක වුවද සේවා කාලයන්ගේ එකතුව ගණන් ගනු ලැබේ.

05.5 කිසියම් අමාත්‍යාංශයක් /දෙපාර්තමේන්තුවක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කලද එම සේවා කාලය එම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කළද එම කාලවල මුළු එකතුව දිස්ත්‍රික්කය තුල සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

05.6 ප්‍රිය මනාප සේවා ස්ථානවල සේවා කාලය ගණන් ගැනීමේ දී නිලධරයා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II හා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ සේවා කාලය තුලදී ප්‍රිය මනාප වූ සේවා ස්ථානයක සේවය කර ඇතිනම් එයද ගණන් ගනු ලැබේ.

05:7 දෙපාර්තමේන්තුවක සේවය කළ කාලය ගණන් ගැනීමේදී, නිලධරයකුගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත, සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

05:8:1 ප්‍රිය මනාප සේවා ස්ථානයක අවුරුදු 05ක සේවා කාලයක් /දුෂ්කර සේවා ස්ථානයක අවුරුදු 02 ක සේවා කාලයක් ඇති නිලධරයෙක් ස්ථාන මාරු ලැබීමට සුදුසුකම් ලබයි.

05:8:2 ප්‍රිය මනාප සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ නොකරන ලද නිලධරයෙක් දුෂ්කර සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම් සේවා අවශ්‍යතාවයන්ට යටත්ව එවැනි ස්ථාන මාරුවක් ලැබීමට සුදුසු වන්නේය.

05:8:3 වසර 05ට වැඩි කාලයක් එකම සේවා ස්ථානයක සේවය කර ඇති නිලධරයන් ස්ථාන මාරුවීම්වලට යටත් වන්නේය.

05:9:1 වාර්ෂික ස්ථාන මාරු සඳහා කාලය ගණනය කරනු ලබන දෙසැම්බර් 31 දිනට (2019 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2018 දෙසැම්බර් 31 දිනට) වයස අවුරුදු 53 ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කය තුල වෙනත් සේවා ස්ථානයකට මාරුකළ හැකි වුවද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.

05:9:2 වාර්ෂික ස්ථාන මාරු සඳහා කාලය ගණනය කරනු ලබන දෙසැම්බර් 31 දිනට (2019 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2018 දෙසැම්බර් 31 දිනට) වයස අවුරුදු 58 ඉක්මවූ නිලධරයන් (59 වැනි වියෙහි පසුවන්නන්) ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුල වුවද මාරු නොකල යුතුය.

05:10 වෘත්තීය සංගමයක මව් සංගමයේ ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍යම විධායක සභිකයන් මාරු කරන්නේ නම් අදාල වෘත්තීය සමිතියේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතුය. ප්‍රිය මනාප දෙපාර්තමේන්තුවලින් පිටතට මාරු කිරීමට මෙය අදාල නොවේ.

05:11 ආයතන සංග්‍රහයේ XXV වන පරිච්ඡේදයේ 7:1 වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්ති විඳීමට අපේක්ෂා කරන වෘත්තීය සංගම්වල නිලධරයන් සංගමයේ ලේකම් මගින් ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් පිළියෙල කර ( 7:5 උප වගන්තිය අනුව) මාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වේ. මේ පිළිබඳව පසුව කෙරෙන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.

05:12 යම් නිලධරයකුගේ කලත්‍රයා පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළයුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එසේම එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ. මෙවැනි නිලධරයන් ප්‍රියමනාප සේවා ස්ථානයකින් පිටතට මාරු කිරීමට සිදුවන්නේ නම් ඊට ආසන්නම කාර්යාලයකට හෝ නිලධරයාගේ ඉල්ලීමකට අදාළ කාර්යාලයට මාරු කළ යුතුය.

05:13 සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු වේ.

05:14 ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක් තැන්ව සිටින කලත්‍රයන් වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන මාරුවීම් කළ යුතු වේ.

05:15 දරුවන් පාසලට යැවීමේ කටයුතුවලට අවහිරයක් නොවන පිණිස හැකිතාක් දුරට සෑම ස්ථාන මාරු කිරීමක්ම ක්‍රියාත්මක විය යුත්තේ එක් එක් අවුරුද්දේ ජනවාරි මස 01 වන දින සිටය.

05:16 ප්‍රියමනාප නොවන්නාවූ කාර්ය ස්ථානයන්හි සේවය සඳහා නිලධරයන් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධරයන්ට වඩා අවිවාහක නිලධරයන් ද පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධරයන් ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට සැලකිලිමත් විය යුතුය.

05:17 ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී සළකා බලනු ලබන්නේ ඒ සඳහා සකස්කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

05:18 මාරුවීම් අයදුම් කරන නිලධරයන් කිසියම් ප්‍රදේශයක නිශ්චිත කාර්යාලයකට පමණක් මාරුවී යාමට අපේක්ෂා කරන්නේ නම් ප්‍රදේශයේ නම හා කාර්යාලයේ නම යන දෙකම සඳහන් කිරීම වරදක් නැත. තමන් මාරුවී යාමට අපේක්ෂා කරන්නේ කිසියම් ප්‍රදේශයකට යාමේ අවශ්‍යතාවය මතද නැතහොත් තමන් කැමති දෙපාර්තමේන්තු හෝ කාර්යාලයකට යාමට උවමනාවෙන්ද යන්න අයදුම්පතෙහි ඇඟවීමක් කිරීම සුදුසුය. ඒ අනුව තමන්ගේ කැමැත්ත අනුපිළිවෙලින් දැක්වෙන පරිදි ප්‍රදේශ හෝ කාර්යාල නම් කළ යුතු වේ.

05:19 නිලධරයාගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව අභියාචනා කිරීමට එම නිලධරයාට හෝ ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට හෝ හිමිකමක් නැත.

## 06 සේවා ස්ථාන වර්ගීකරණය

06:1:1 ප්‍රියමනාප සේවා ස්ථාන/ප්‍රදේශ ලෙස හඳුනාගත් සේවා ස්ථානවල/ප්‍රදේශවල නම්, සේවාවන් අනුව වාර්ෂිකව ප්‍රසිද්ධ කෙරේ. මෙම ස්ථාන හා ප්‍රදේශ නිලධරයන්ගේ ප්‍රතිචාර අනුව විටින් විට වෙනස් විය හැක. සේවාවන් අනුව ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස හඳුනාගත් දෙපාර්තමේන්තුවල ලේඛණයක් උප ලේඛණ අංක 01 යටතේ මේ සමග අමුණා ඇත.

06:1:2 දෙවන උපලේඛණයේ සඳහන් කාර්යාලයකට ස්ථාන මාරුවීමක් ඉල්ලා සිටියද එම සේවා ස්ථානයට ස්ථාන මාරු නියෝග නිකුත් කිරීමට පෙර ඒ පිළිබඳව උපලේඛණයේ දැක්වෙන දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කෙරේ.

06:2 ප්‍රියමනාප සේවා ස්ථානයක හෝ ස්ථානවල වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධරයන් නැවත ප්‍රියමනාප සේවා ස්ථානයකට මාරු කල යුත්තේ වෙනත් ඉල්ලීම් නැත්නම් පමණි.

06:3 ප්‍රියමනාප දෙපාර්තමේන්තුවල/ප්‍රදේශවල වසර 05ට වඩා සේවය කළ නිලධරයන්ගේ නාම ලේඛණයක් ඔවුන්ගේ වයස, සේවා කාලය, පදිංචි ප්‍රදේශය, ස්ථාන මාරු කළහොත් මාරුවී යාමට කැමති සේවා ස්ථාන 03ක්, යනාදී සියලු තොරතුරු අදාල ආකෘතියෙන් නිවැරදිව සම්පූර්ණ කර රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වනු ලබන දිනට පෙර එවීම අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ / දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීම වන්නේය.

06:4 සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වසර 05ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන්ගේ වාර්තාවක් ආකෘති පත්‍ර අංක 2 අනුව (ඇමුණුම් 02) 5:5 උප වගන්තියේ දැක්වෙන පරිදි දිස්ත්‍රික්ක අනුව සකස් කර එවීමට අමාත්‍යාංශ ලේකම්වරු හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඉතා වගකීමෙන් යුතුව කටයුතු කළ යුතු වේ.

06:5 ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක සේවය කළ නිලධරයෙකු ස්ථාන මාරුවීමක් ඉල්ලූ විට එම ඉල්ලීම ඉටු කිරීමට 6:2 හා 6:3 උප වගන්තිවල අවශ්‍යතා සපුරා ඇති එකී ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයා ඉන් පිටතට මාරුකළ හැකිය.

06:6 ප්‍රියමනාප ප්‍රදේශවලට ස්ථාන මාරුවීම් ලබා දීමේදී වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ ප්‍රියමනාප නොවන ස්ථානවල සේවය කළ නිලධරයන්ටය. එමෙන්ම සේවා කාලය හා නිලධරයන් විසින් දැනුම් දී ඇත්නම් ඔවුන්ට ප්‍රායෝගිකව මුහුණ දීමට සිදුවන ප්‍රශ්න ද සළකා බලනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමට නිලධරයන් කටයුතු කළ යුතුය.

06:7 06:3 හා 06:4 උප වගන්තිවල දැක්වෙන නිලධරයන් පිටතට මාරු කිරීමේදී ඔවුන් කැමැත්ත දක්වා ඇති ස්ථාන 02ක් අතුරෙන් එකකට මාරු කිරීමට හැකිතාක් උත්සාහ ගන්නා අතර එසේ නොහැකි වුවහොත් හැකි ආසන්න ස්ථානයකට මාරු කරනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමට නිලධරයන් කටයුතු කළ යුතුය.

06:8 ස්ථාන මාරුවීම් ලැබේ යයි අපේක්ෂා කරන නිලධරයන් ගේ රාජකාරි, කල් ඇතිව වෙනත් නිලධරයන්ට පුහුණුකර වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කල යුතුය.

06:9. වාර්ෂික ස්ථාන මාරු නියෝගයන් පිළිනොපදින හෝ ක්‍රියාත්මක නොකරන නිලධරයන් පිළිබඳව රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත වාර්තා වුවහොත්, ඒ පිළිබඳව තව දුරටත් දැනුම් දීමකින් තොරව අදාල විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

07. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළයුතු කාල සටහන.

| | |
|---|---|
| ජූනි මස 01 වන දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවීම |
| ජූනි මස 30 වන දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම |
| ජූලි මස 31 වන දිනට පෙර | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාල බලධාරියා වෙත ඉදිරිපත් කිරීම |
| අගෝස්තු මස 15 දිනට පෙර | අදාල බලධරයා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම |
| අගෝස්තු 31 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාල බලධාරියා වෙත ලිඛිතව භාර දීම. |
| සැප්තැම්බර් 15 දිනට පෙර | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම |
| සැප්තැම්බර් 30 දිනට පෙර | ස්ථාන මාරුවීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය |
| ඔක්තෝබර් මස 15 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාල බලධාරියා වෙත ලිඛිතව භාරදීම |
| නොවැම්බර් මස 01 වන දිනට පෙර | අවසාන ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කිරීම |
| නොවැම්බර් මස 15 වන දිනට පෙර | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම |
| ජනවාරි මස 01වන දින සිට | වාර්ෂික ස්ථාන මාරු බලාත්මක කිරීම |

## 08. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර

8.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය ආකෘති පත්‍ර 3a හා 3b ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තවද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාල ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනය සමග ඉදිරිපත් කිරීමටද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

8.2 රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ, අදාල අමාත්‍යාංශයේ ලේකම් මගින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම අදාල අමාත්‍යාංශයේ ලේකම් ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

8.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධාරියා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

8.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාල සියලු ලිපිගොණු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේය. එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපිගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමග එම දෙසැම්බර් මස 01 වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

8.5 මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචන ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සළකා බලනු නොබලන්නේය.

8.6 ඉහත 8.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

8.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාල අමාත්‍යාංශයේ ලේකම් වෙත යවනු ලබන්නේය.

8.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ
අමාත්‍යාංශ ලේකම්

දිනය : 2018.09.04

නිල මුද්‍රාව :

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.

## 1 වන උප ලේඛණය
## ප්‍රියමනාප දෙපාර්තමේන්තු

01. රේගු දෙපාර්තමේන්තුව.
02. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව.
03. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.
04. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව.
05. රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
06. සුරාබදු දෙපාර්තමේන්තුව.
07. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.
08. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

## 2 වන උප ලේඛණය.
## පූර්ව අනුමැතියට යටත්ව මාරුවීම් කරන දෙපාර්තමේන්තු

01. ජනාධිපති කාර්යාලය.
02. අග්‍රාමාත්‍ය කාර්යාලය.
03. අමාත්‍ය මණ්ඩල කාර්යාලය.
04. විපක්ෂ නායක කාර්යාලය.
05. රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
06. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව.
07. මැතිවරණ කොමිෂන් සභාව.

| ඒ.සේ. /වා.ස්.මා. /01 |
|---|

# ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තිය

| තනතුර | | ඉ-මානව සම්පත් අංකය<br>(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණී) | |
|---|---|---|---|

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| **01.** සම්පූර්ණ නම:- | | | |
| **02.** මුලකුරු සමග නම:- (සිංහලෙන්) | | | |
| **03.** මුලකුරු සමග නම:- (ඉංග්‍රීසියෙන්) | | | |
| **04.** උපන් දිනය:-<br>YYYY/MM/DD | **05.** වයස:- (2018.12.31දිනට)<br>අවු.............මාස.......දින...... | **06.** ජාතික හැඳුනුම්පත් අංකය:- | **07.** ස්ත්‍රී/පුරුෂ භාවය:- |
| **08.** ස්ථිර ලිපිනය:- | **09.** තාවකාලික ලිපිනය:- | **10.** දුරකථන අංකය<br>කාර්යාලය:-<br>පෞද්ගලික:- | |
| **11.** විවාහක අවිවාහක බව:- | **12.** කලත්‍රයාගේ නම:- | **13.** කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:- | |
| **14.** දරුවන් ගණන | **15.** ඔවුන්ගේ වයස:- | **16.** ඉගෙනුම ලබන පාසැල :- | |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| **17.** පත්වීම් ලිපියේ අංකය:- | **18.** රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට පත්වූ දිනය:- |
| **19.** වර්තමාන සේවා ස්ථානය:- | **20.** සේවා ස්ථානය පිහිටි නගරය:- |
| **21.** වර්තමාන සේවා ස්ථානයට වාර්තාකල දිනය :-<br>YYYY/MM/DD | **22.** වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය :-<br>(2018.12.31 දිනට)<br>අවු...........මාස............දින......... |

| 23. ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක සේවය කර තිබේ ද? (ප්‍රියමනාප) | |
|---|---|

<table>
<tr><td rowspan="7">24. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන</td><td colspan="2" rowspan="2">සේවා ස්ථානය</td><td colspan="2">සේවා කාලය</td></tr>
<tr><td>සිට</td><td>දක්වා</td></tr>
<tr><td>1</td><td></td><td></td><td></td></tr>
<tr><td>2</td><td></td><td></td><td></td></tr>
<tr><td>3</td><td></td><td></td><td></td></tr>
<tr><td>4</td><td></td><td></td><td></td></tr>
<tr><td>5</td><td></td><td></td><td></td></tr>
</table>

ඈ. <u>ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු</u>

<table>
<tr><td>25.</td><td>සේවා ස්ථානය</td><td>සේවා ස්ථානය පිහිටි නගරය</td></tr>
<tr><td>1</td><td></td><td></td></tr>
<tr><td>2</td><td></td><td></td></tr>
<tr><td>3</td><td></td><td></td></tr>
<tr><td colspan="3">26. ඉහත සඳහන් කර ඇති සේවා ස්ථාන වලට අමතරව ඊට ආසන්න සේවා ස්ථානයකට ස්ථාන මාරුවීමක් ලබා දෙන්නේ නම් එයට එකඟද?<br><br>27 ස්ථාන මාරු ඉල්ලුම් කිරීමට හේතු:- (නිලධාරියා හෝ යැපෙන්නන් යම් ආබාධිත තත්වයකින් පෙලෙන්නේ නම් ඒ බවට වෛද්‍ය සහතික වලින් තහවුරු කිරීමට යටත්ව මෙහි සඳහන් කරන්න )</td></tr>
</table>

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

.................................                                        .................................

දිනය                                                                      අත්සන

ඇ. <u>අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය:-</u>

- ඉහත නම සඳහන් නිලධාරියාගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව/ රහිතව/ පසුව ලබාදීමේ පදනම මත නිර්දේශ කරමි.

.................................                                        .................................

දිනය                                                                      අත්සන

නිල මුද්‍රාව

ආකෘති පත්‍ර අංක 02

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව:....................................................

පළාත් අමාත්‍යාංශය/ පළාත් දෙපාර්තමේන්තුව/ පළාත් පාලන ආයතනය/ පළාත් ලේකම් කාර්යාලය/ ප්‍රාදේශීය කාර්යාලය:..........................................................................................

| අනු අංකය | නිලධාරියාගේ නම (මයා/මිය/මෙය යන්න සඳහන් කරන්න) | පත්වීම් දිනය | ජාතික හැඳුනුම්පත් අංකය | තනතුර/ශ්‍රේණිය හා මාධ්‍යය | උපන්දිනය හා 2018.12.31 දිනට වයස | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2018.12.31 දිනට | විවාහක/අවිවාහක බව කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් ගණන/වයස/ඉගෙනුම ලබන පාසැල් | දැනට පදිංචි ප්‍රදේශය හා ලිපිනය | මුල් පත්වීමේ සිට සේවා ස්ථාන හා කාලසීමාවන් | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කර නොමැති නම් ස්ථාන මාරුවක් ලැබුණහොත් සේවය කිරීමට කැමති ස්ථාන 03ක් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

සකස් කළේ : නම: ..................................... අත්සන:............................ තනතුර:.................................

පරීක්ෂා කළේ: නම:..................................... අත්සන:............................ තනතුර:.................................

දිනය:.......................................

.........................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව